# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1711/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 14/11/2024 පැය 1040

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. බලපත්‍ර නොමැතිව අනවසරයෙන් රක්ෂිතයකට ඇතුළු වී තේක්ක දැව කඳන් කපා වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2024.11.14 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාන්කුලම් පොලිස් වසමේ ඔට්ටුසුඩාන් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අනවසරයෙන් රක්ෂිතයකට ඇතුළු වී බලපත්‍ර නොමැතිව තේක්ක දැව කඳන් 13 ක් කපා වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඕලුමඩු අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**02. බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.11.13 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් විසින් වීරකැටිය පොලිස් වසමේදී වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු බෝතල් 40 ක් සන්තකයේ තබා ගෙන ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වීරකැටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ බෙලිඅත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**